# ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සේවා නියුක්තිය






එම්.බී ඉරෝෂිකා බණ්ඩාර

සංවර්ධන නිළධාරි

මිනිස්බල සැලසුම් හා සංවර්ධන හා පර්යේෂණ අංශය

# ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සේවා නියුක්තිය

මෑත වසරවලදී ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පහළම ආර්ථික වර්ධන අනුපාතයන් වාර්තා කර තිබේ. රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ගෙන් තුනෙන් දෙකකට ආසන්න සංඛ්‍යාවක් දුර්වල සේවා කොන්දේසි යටතේ අවිධිමත් රැකියා සඳහා අඩු වැටුප් උපයති. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ අගය එකතු කළ අංශ කරා අඛණ්ඩව ව්‍යාප්ත කිරීමට හා දුප්පත්කම අඩු කිරීමට නම් එය කාර්යක්ෂමතාවයෙන් යුක්ත විය යුතුය. එහෙත් ශ්‍රී ලංකාවේ සමාගම්, කාර්මික ශිල්පීන්ගේ ගුණාත්මකභාවය හා සැපයුම  අතර පවතින දුරස්ථ බව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට බාධකයන් වන අතර මේ අනුව ප්‍රධාන කුසලතා හිඟය හා නොගැලපීම්  රටේ සංවර්ධන ප්‍රයත්නයන් වලක්වනු ඇත.

**Figure 1.1 දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ශ්‍රී ලංකාව සහ සාර්ක් කලාපය**

(GDP Growth Srilanka and the region 2018-2019)




[1]

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සාර්ක් කලාපීය අනෙකුත් රටවල් හා බැලීමේදී ශ්‍රී ලංකාවේ වර්ධන වේගය 2018 වර්ෂයේ 3.3% ක් වූ අතර 2019 වර්ෂයේ 2.3% ක් ලෙසද ඉතාම අඩු අගයක් ගනියි.

[1] https://data.world bank.org/Indicator

**Figure 1.2** දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන ආර්ථික අංශ




2

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය දක්වන ප්‍රධාන ආර්ථික අංශ වන්නේ කෘෂිකර්මාන්තය,කාර්මික සහ සේවා යන අංශයි. දළ දේශීය නිෂ්පාදිතයට 2018 වර්ෂයේදී වැඩි ලෙසම දායකත්වය දක්වන ලද අංශය කෘෂිකර්මාන්තය වන අතර එය 4.8ක අගයක් වෙයි.

**Figure 1.3** සේවා නියුක්තියේ ආංශික දායකත්වය – 2018




3

---

[2] Central Bank Annual Report, (2018),3-KEI.pdf

[3] Central bank report (2018),(pp.133)

සේවා නියුක්තියේ ව්‍යුහාත්මක මාරුව වඩාත් සෙමින් සිදුවී ඇත. 2018 දී සේවා නියුක්තිකයන්ගෙන් 25.5 ක් කෘෂිකාර්මික හා ධීවර අංශයේ සේවය කරන අතර, මූල්‍ය හා දේපළ වෙළඳාම් වැනි ඉහළ අගය එකතු කළහැකි හා නිපුණතා සහිත වැඩි අගයක් එකතු කළ හැකි කාර්මික අංශයේ සේවා නියුක්තිය 27.9 ක් හා සේවා අංශයේ සේවා නියුක්තිය 46.6 ක අගයක් ගනියි.

**Figure 1.4** දළ දේශීය නිෂ්පාදිත වර්ධනය සහ සමස්ත රැකියා සඳහා ආංශික දායකත්වය



[4]

සේවා නියුක්තිය කෘෂිකාර්මික අංශයේ 21.5 ඉහළම අගයක් ගනු ලබන අතර දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය 8.9 වෙයි. දළ දේශීය නිෂ්පාදිත වර්ධනය සඳහා අවම දායකත්වය දක්වා ඇත්තේ දේපල වෙළඳාම්, කුලී සහ ව්‍යාපාරික කටයුතු යන අංශ වෙයි.

---

[4] Central Bank Annual Report, (2018,8 –chapter-04-pdf (p.136)

Figure 1.5 ශ්‍රම බලකායේ සහභාගීත්වය සහ විරැකියා අනුපාතය-2018



[5]

ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්තිය 2018 වර්ෂයේදී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 51.8ක් වන අතර කාන්තා ශ්‍රම දායකත්වය 33.6 කි. කාන්තා පාර්ශවයේ සේවා වියුක්තිය 7.1 කි. වැඩ කරන වයසේ ජනගහන (අවුරුදු 15  සහ ඊට වැඩි) වර්ධනය සුළු සංඛ්‍යාවක් වන බව 2017 වර්ෂයේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ සමස්තයට වඩා (15,843,735) සහ 2018 වර්ෂයේදී(16,225,975) එහි වැඩිවීම සුළු සංඛ්‍යාවක් වීමෙන් පැහැදිලි වෙයි. ඒ අනුව පෙනි යන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගයේ පහත වැටීමක් සිදුව ඇත්තේ දළ දේශීය නිෂ්පාදනය සඳහා  ශ්‍රම බලකා සහභාගිත්වයේ අඩු දායකත්වය ප්‍රධාන හේතුව  බවයි.

[5] මූලාශ්‍රය:Department of Statistics  Labour force Report, (2018),IV

තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා ....

- තිරසාර ආර්ථික වර්ධනය සඳහා සෘජුවම දායකත්වයක් දැක්විය හැකි ගුවන් සේවා,වාණිජ,බලශක්ති යන අංශයන්හි දැනුම සහ නිපුණතා වලින් යුතු ශ්‍රම බලකායක් බිහි කිරීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනය කිරීම කළ යුතුය.

- ප්‍රතිපත්ති සම්පාදකයින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතියේ වැඩිවන කොටස් හා වර්ධනය සඳහා අඛණ්ඩව නිෂ්පාදන හා සේවා අංශ කෙරෙහි අවධානය යොමු කරන බැවින්, තරඟකාරිත්වය ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව රැකියා විශේෂිත තාක්ෂණික හා වෘත්තීය කුසලතා ගොඩනැගීම සඳහා ආයෝජනය සිදු කළ යුතුය.

- යන්ත්‍ර ක්‍රියාකරුවන් ,කාර්මික ශිල්පීන්, විකුණුම් පුද්ගලික, වෘත්තිකයන් සහ කළමනාකරුවන් විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කාර්යක්ෂමතාවයෙන් යුත් ආර්ථිකයකට සංක්‍රමණය වන අනුපාතය තීරණය කරනු ඇත.එම වෘත්තිකයින්ගේ සේවා නියුක්තිය වර්ධනය කල යුතුය.

- වඩාත්ම වැදගත් වන්නේ දරිද්‍රතාවය පහළ නැංවීම , ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ වර්තමාන ශ්‍රී ලාංකිකයින්ගේ සමාජ ආරක්ෂාව සඳහා අරමුදල් සම්පාදනය කිරීම සඳහා ඉතුරුම් උත්පාදනය කිරීම වෙනුවෙන් කුසලතා ඉහළ නැංවීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම ය.